00241

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II – 2023/2024

**LLU 6814 - දිලික්ත නීතිය**

කාලය : පැය එකයි (01)

දිනය : 2025 ජනවාරි 11 වේලාව : ප.ව. 03.30 - ප.ව. 04.30

මුළු ප්‍රශ්න ගණන : දෙකයි (02)

<u>එක් (01) ප්‍රශ්නයකට පමණක්</u> පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. පිහිනුම් ශූරයෙකු වූ සුදත්, මිතුරන් පිරිසක් සමඟ සති අන්ත නිවාඩුව ගත කිරීම පිණිස හික්කඩුවේ පිහිටි Blue Moon Beach අවන්හල වෙත පැමිණියේය. එහිදී ඔවුන් අධික ලෙස මත්පැන් පානය කළහ. ඒ වන විට රෑ බෝවී තිබූ බැවින් අවන්හලෙන් මුහුදු වෙරළ වෙත පිවිසීමට තිබූ දොරටුව වසා තිබුණි. සුදත් සහ ඔහුගේ යහළුවන් එම දොරටුව විවෘත කිරීමට ප්‍රයත්න දැරූහ. එම අවස්ථාවේදී අවන්හලෙහි ආරක්ෂක නිලධාරීන් එම දොරටුව විවෘත නොකරන ලෙසත් මුහුදේ පිහිනීමට නොයන ලෙසත් අවවාද කළහ. සුදත් සහ ඔහුගේ පිරිස අවන්හලෙහි ආරක්ෂක නිලධාරියාගේ අනතුරු ඇඟවීම් නොතකා බලහත්කාරයෙන් දොරටුව විවෘත කර, මුහුදු වෙරළට පිවිස පිහිනූහ. එම වේලාවේදී, මුහුද රළුව තිබූ බැවින් Blue Moon Beach අවන්හල විසින් ඉදිකරන ලද මුහුදු පවුරේ කොටසක සුදත්ගේ හිස ගැටීමෙන් ඔහු ස්ථිරව අංශභාග රෝගියෙකු බවට පත් විය. මෙම අනතුර සියසින් දුටු සුදත්ගේ මිතුරෙකු වූ සමන්, අතිශයෙන්ම කම්පනයට පත් වූ අතර ඔහුට දැඩි කාංසාව සහ නපුරු සිහින පෙනීමේ රෝග ලක්ෂණ වර්ධනය විය.

   සුදත් සහ සමන් ඔවුන්ට සිදු වූ හානි සම්බන්ධව Blue Moon Beach අවන්හලට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අදහස් කරයි.

   දිලික්ත වගකීමට අදාළ මූලධර්ම ඇසුරින් ඔවුන්ට උපදෙස් දෙන්න. ඔබේ පිළිතුර අදාළ නඩු නීතිය ඇසුරින් පහදන්න. (ලකුණු 20)

2. "ශුද්ධ ආර්ථික හානි; මූල්‍ය හානි වලින් වෙනස් බැවින්, ඒ සම්බන්ධ ගැටළුවලට ප්‍රතිචාර දැක්වීමේදී බොහෝ විට අධිකරණය සීමාකාරී ප්‍රවේශයක් අනුගමනය කරයි."

   ශ්‍රී ලංකාවේ, දකුණු අප්‍රිකාවේ සහ එංගලන්තයේ ශුද්ධ ආර්ථික හානි සම්බන්ධ අධිකරණ ප්‍රවේශ ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

   ඔබේ පිළිතුර උචිත නඩුතීරණ මඟින් තහවුරු කරන්න. (ලකුණු 20)

***හිමිකම් ඇවිරිණි***